මෙරටේ කෘෂිකර්ම ක්ෂේත්‍රය දෙස නෙත් යොමන විට පෙනී යන අඩුපාඩුවක් නම් මෙම ක්ෂේත්‍රයෙහි සංවිධාන ශක්තියෙහි හීන භාවයයි. බොහෝ දෙනා පෙන්වා දෙන පරිදිම මෙරටේ බහුතරය වන ගොවිජනතාව සංවිධාන වී නොසිටිති. එලෙසින්ම ගොවිජනතාවගේ ශ්‍රමය හා දැනුම උපයෝගී කර ගෙන රටට අවශ්‍ය ආහාර භෝග නිෂ්පාදනය කිරීමේ සංවිධානාත්මක අංග සම්පූර්ණ වැඩ පිළිවෙලක් ද නැත. එලෙසින්ම ඔවුන්ට අවශ්‍ය යෙදවුම් ආධාරක සේවා හා ණය පහසුවෙන් ලබා ගැනීමට, ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමට ද සහාය වන සංවිධාන ප්‍රමාණවත් නොවේ.

## අඩුපාඩු

ශ්‍රමය පිළිබඳව තවදුරටත් සළකා බලන විට පෙනී යන්නේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා සැළසුම් වලද අඩුපාඩු ඇති බවයි. මෙම කරුණු පැහැදිලි කරනු පිණිස මම එක් නිදසුනක් ගෙන හැර පානු කැමැත්තෙමි. අපේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය වන්නේ අර්තාපල්, ලූණු හා මිරිස් වැනි අතුරු ආහාර භෝග නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමය. ප්‍රතිපත්තිය මෙසේ වුවත් අර්තාපල් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය බීජ මෙරටේ නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කර නො තිබිණ. එහෙයින් විශාල විදේශ විනිමයක් වැය කර එතෙරින් බීජ ගෙන්වීමට සිදුවූ හෙයින්, අපේ අර්තාපල් නිෂ්පාදන තත්ත්වය එතෙර බීජවල ගුණාත්මක වටිනාකම මත රඳා පැවැතිණ. එහෙයින් මෙරටට අවශ්‍ය අර්තාපල් බීජ මෙරටෙහිම නිෂ්පාදනය කිරීම සඳහා දැන් වැඩ පිළිවෙලක් සකස් වෙමින් පවතී. අපේ රටට අවශ්‍ය අර්තාපල් අපට නිපදවා ගැනීමට එය මහත් රුකුලක් වනු ඇත.

## සම්ප්‍රදයික ඉලක්කය

මිරිස් නිෂ්පාදනය පිළිබඳව ද ඇත්තේ මෙයට සමාන තත්ත්වයකි. මෙරටේ පාරිභෝජන රටාවට ගැලපෙන මිරිස් නිෂ්පාදන ඉලක්කයන් මෙතෙක් අප සතුව නොතිබිණ. එහෙයින් මෙරටේ පාරිභෝජන අවශ්‍යතා සපිරීමට හැකි වන පරිදි ස්ථිර ඉලක්කයක් මගින් මිරිස් නිෂ්පාදනය ක්‍රමානුකූලව කිරීම සඳහා දැනට පියවර ගෙන ඇත.

✡ ✡ ✡

රතු ළූනු වගාව මෙතෙක් කෙරුණේ වසරේ එක් කන්නයකදී පමණි. මෙතෙක් කර ගෙන ආ පිළිවෙත අනුව අප්‍රේල් හෝ මැයි මාසවලදී ළූනු වගා කෙරෙන අතර ජූලි මාසයේදී පමණ අස්වනු ලබා ගනු ලැබේ. එහෙත් අපේ කෘෂි පාරිසරික කලාපවල විවිධත්වය ගැන සළකා බලන විට, ජනවාරි මාසයේ සිටම දිවයිනේ විවිධ පළාත්වල ළූනු වගාව ආරම්භ කළ හැකි බව පෙනී යයි. මේ මගින් වර්ෂයේ වැඩි කාලයක් තිස්සේ අස්වනු ලබා ගැනීමට හැකි වන අතරම දිවයිනේ විවිධ ප්‍රදේශවලට නිෂ්පාදනය ව්‍යාප්ත කිරීමටත්, එමගින් නිෂ්පාදනය වැඩි කිරීමටත් හැකියාව ලැබෙනු ඇත.

# අප යො ශු

කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍ය

**ගරු ආර්. ඇම්. ධර්මදස බණ්ඩා**
**විසිනි.**

✡ ✡ ✡

මෙරටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි විශාලතම අභියෝගය වන්නේ අපේ සම්ප්‍රදයික ඉලක්කය වන සහලින් රට ස්වයංපෝෂිත කිරීමයි. වී වගාවට උපයෝගී කර ගත හැකි ඉඩම් ප්‍රමාණය දැනටම ප්‍රයෝජනයට ගෙන ඇති හෙයින් එය වැඩි කළ නොහැකිය. ඒ සමඟම දිනෙන් දින ජනගහණය වැඩි වේ. මෙරටේ වාර්ෂික ඒකපුද්ගල සහල් පාරිභෝජනය කිලෝග්‍රෑම් 104 ක් ලෙස සළකන විට මෙම අරමුණු ඉටු කර ගැනීම බැරෑරුම් කටයුත්තක් බව පැහැදිලිය. එහෙයින් දැනට මෙරටේ ඇති කුඹුරු අක්කර විසි ලක්ෂයේ නිෂ්පාදනය සීඝ්‍රයෙන් වර්ධනය කළ යුතු වෙයි. ඒ සඳහා වැඩි අස්වනු ලබා දෙන වී වර්ග නිෂ්පාදනය කළ යුතුය. අපේ පර්යේෂණ ප්‍රතිඵල අනුව මෙම අරමුණ ඉටු කර ගත හැකි බව දැන් පෙනී ගොස් ඇත. මේ සඳහා ගොවීන්ට දිරිදීමක් වශයෙන් වැඩි වූ පොහොර මිළ යම් ප්‍රමාණයකට හෝ අඩු කිරීමට අපට හැකි විය. පොහොර මිළ තවදුරටත් අඩු කරනු පිණිස අමිශ්‍ර පොහොර වෙළඳ පොළට හඳුන්වා දීමටද පියවර ගෙන ඇත. මෙමගින් ගොවීන්ට රු. 300 ක පමණ ලාභයක් ඇති වේ. ඒ සමඟම කාබනික පොහොර යොදන වගාවල පෝෂණීය කොටස්වල අසමතුලිත තාවයන් ද මේ මගින් මගහරවා ගත හැකිය.

# ූ මග

## අපනයනය

කෘෂි ක්ෂේත්‍රයෙහි තවත් වැඩිදියුණු කළ යුතු අංශයක් නම් අපනයනය කිරීමය. සම්ප්‍රදායික නොවන අපනයන භෝග වන එළවළු, පළතුරු නිෂ්පාදනය වර්ධනය කිරීමෙහි ා දැනට ගෙන ඇති ප්‍රයත්න තවදුරටත් වර්ධනය කිරීමට ටයුතු කර ඇත. මෙයට අමතරව කෘෂි අපනයන භෝග නිෂ්පාදනය කිරීමෙහිලා විශාල ප්‍රයත්නයක් දරනු ඇත. 1989 වසරේදී මෙම අංශයෙන් අප රට ඉපැයූ ආදායම රුපියල් කෝටි 150 කට අධිකය. මෙම ආදායම ලබා ගෙන ඇත්තේ අක්කර ලක්ෂයක වගා ප්‍රමාණයකිනි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නව ව්‍යාපෘති වැඩ සටහන යටතේ මෙම භෝග වවන ඉඩම් ප්‍රමාණය වසර තුනකදී දෙගුණ කිරීමට අපේක්ෂා කෙරේ.

☼ ☼ ☼

කිරි නිෂ්පාදනය වර්ධනය ද තවත් අංගයක් වෙයි. මෙරටට වසරකට ආනයනය කරන කිරි පිටි මෙට්‍රික් ටොන් 30.000න් අනෙකුත් ඉතිරි ආශ්‍රිත නිෂ්පාදනයන්හි පාරිභෝජනයත් වැඩි වන ජනගහණයත් අනුව සළකා බලන විට දැනට පවතින නිෂ්පාදන ප්‍රමාණයට වඩා, වසරකදී කිරි ලීටර් මිලියන 350 ක් නිපදවිය යුතුය. වෙනත් වචනයකින් කිව හොත් දෛනික කිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්ෂයකින් පමණ වැඩි කළ යුතුය. මේ සඳහා වැඩි කිරි නිෂ්පාදනය කරන ගවයන් ආනයන කර අපේ ගව සම්පතේ පලදායිතාවයද වර්ධනය කළ යුතුය. මෙම ඉලක්ක සැපිරීමට වසරකට උසස් වර්ගයේ එළදෙනුන් 50,000 ක් 100,000 ක් අතර ප්‍රමාණයක් හඳුන්වා දිය යුතු වෙයි.

## දෙපියවරක්

කෘෂි ක්ෂේත්‍රයෙහි මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම ලිපියේ ඉහතින් සඳහන් කරන ලද ප්‍රශ්ණ මග හැරවීම සඳහා පියවර දෙකක් ගත යුතු වේ. ඉන් පළමු වැන්න ගොවීන් සංවිධාන කිරීමයි. මෙමඟින් ගොවි ජනතාවට ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න මග හරවා ගත හැකි වනු ඇත. දෙවැන්න ගොවි ජනතාවට අලෙවි පහසුකම් සැළසිය යුතුය. මේ සඳහා සෑම දිසාපති කොට්ඨාශයකම අලෙවි මධ්‍යස්ථාන

**කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමති ආර්. ඇම්. ධර්මදාස බණ්ඩා මහතා රටට අදාශ්‍ය නව කෘෂි කාර්මික ප්‍රතිපත්ති හා කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ සිදුවිය යුතු ආකල්ප වෙනස පිළිබඳව කරුණුදක්වමින් 'ගොවි ජනතාව' සමග කළ සාකච්ඡාවකින් මෙම ලිපිය සකස් කරන ලදී.**

පිහිටුවීමට දැනටම පියවර ගෙන ඇත. සමූපකාර සමිති, පෞද්ගලික සමාගම් හෝ පුද්ගලයන්ට මෙම මධ්‍යස්ථාන පිහිටුවිය හැකි අතර ඒ සඳහා රුපියල් දශලක්ෂයක ණය මුදලක් සැපයෙනු ඇත. වසර තුනක සහන කාල සීමාවකින් පසුව සියයට 3 ක් වන සුළු පොලියක් සහිත මෙම ණය වසර පහකදී ගෙවිය යුතු වේ. මේ මඟින් මෙරට කෘෂි අලෙවි රටාවේ විශාල පෙරළියක් සිදු වෙනු ඇත.

☼ ☼ ☼

මා නියෝජනය කරන මොණරාගල දිස්ත්‍රික්කයේ කෘෂි කාර්මික කටයුතු පිළිබඳව විමසන කල්හි පෙනී යන කරුණක් නම් සීනි නිෂ්පාදනය වර්ධනය කිරීමට ඇති හැකියාවය. මේ සඳහා දිනකට උක් ටොන් 2000 ක් අතර ප්‍රමාණය ඇඹරිය හැකි සීනි හල් කිහිපයක් ඇරඹිය යුතුය. මේ එක් කම්හලකින් අක්කර 20,000 ක පමණ වගාවක අස්වැන්නෙන් නිෂ්පාදනය කළ හැකි අතර පවුල් 7000 කට පමණ ස්ථිර ජීවනෝපායක් සළසා ගත හැකි වෙයි. ඒ සමඟම සම්ප්‍රදායික දෙඩම් නිෂ්පාදන ප්‍රදේශයක් වන බිබිලේ උසස් වර්ගයේ නව දොඩම් නිපදවීමට ද පියවර ගෙන ඇත. ඒ සමඟම මෙම දිස්ත්‍රික්කයේ කුඹුරුවල යල කන්නයේදී එළවළු හා අනෙක් අතුරු ආහාර භෝග වගාව වර්ධනයට ද සැළසුම් සකස් වෙමින් පවතී.

☼ ☼ ☼